# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2017

## Primary Piriven Mid-Year Term Test - 2017

### 3 වසර / Grade 3

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**ඉතිහාසය** කාලය : පැය තුනයි

**History** Time : Three hours

❖ **I වන කොටසේ ඇති ප්‍රශ්න සියල්ලටත්, II වන කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**

01 A. නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i "ඉතිහාසය එක් විෂයක් නොව විෂයන් සියල්ල අන්තර්ගත ගෘහය යි." යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ.................................................... (ජී. එච්. ට්‍රෙව්ලියන්, ඊ. එච්. කාර්) ය.

ii ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ ස්ථානයක් වන්නේ ............................................... (බෙල්ලන්බැදිපැලැස්ස, තලගල) ය.

iii ශ්‍රී ලංකාවේ වැඩිම පළල සටහන් වන්නේ කොළඹ සිට ......................................... (දෙවුන්දර, සංගමන්කන්ද) තුඩුව දක්වා ය.

iv ලංකාවේ මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වන ගංගාවකි, .................................. (ගිං.වලවේ.)

v ලක්දිවට පැමිණි ආර්ය ජන කණ්ඩායමක් වන්නේ ........................................ (පණ්ඩු පාරින්ද, විජය) ඇතුළු පිරිසයි.

vi පළමුවරට අනුරාධපුරය අගනුවර වශයෙන් තෝරාගත් සිංහල රජු වන්නේ .............................. (පණ්ඩුකාභය, විජය) රජු ය.

vii වළගම්බා රජු දවස සිදු වූ ඓතිහාසික ශාසනික සිදුවීමක් වන්නේ (තීය බමුණාගේ ආක්‍රමණය, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරවීම) ය.

viii ධාතුසේන රජු ඉදිකළ වැවක් වන්නේ ............................... (කලා වැව, තිසා වැව) යි.

ix "සිල්වත් සමාගම" නමින් සංවිධානයක් ආරම්භ කළේ ............................ යුගයේ දී ය. (දඹදෙණි, මහනුවර)

x දඹදෙණි යුගයට අයත් පිරිවෙණකි, ............................................... (දෙවුන්දර නන්දන පිරිවෙණ, කැරගල පද්මාවතී පිරිවෙණ) (ලකුණු 2 x 10= 20)

02 B. පහත සඳහන් රූප සටහන් නම් කරන්න.

A



B



C



i. ................................................ ii. ................................................ iii. ................................................

iv A රූපය නිර්මාණය කිරීමට දයක වූ කමිටුවේ සභාපති වූයේ කවු ද?

v අපේ ජාතික කොඩියේ කොළ පාට තීරුවෙන් සංකේතවත් කරන්නේ කුමක් ද?

vi B රූපයේ දක්නට ලැබෙන ස්තූපය කවර රජෙකුගේ නිර්මාණයක් ද?

vii මේ රූපය පිහිටි දිස්ත්‍රික්කය නම් කරන්න.

viii C රූපයේ දක්නට ලැබෙන නිර්මාණය අයත් පැරණි රාජධානිය නම් කරන්න.

ix C රූපය ඉදිකරන ලද රජතුමා කවු ද?

x ලංකාවේ ජාතික පුෂ්පය නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

## II කොටස

02

i 'අතීතය තුළින් වර්තමානය හා අනාගතය හඳුනා ගත හැකි ය' යන්න කාගේ ප්‍රකාශයක් ද?

ii ඓතිහාසික කාලවකවානු දැක්වීමට යොදගත් නියමයන් තුනක් ලියා ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න.

iii ඉතිහාසය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

03

i ලක්දිවට පැමිණි මුල් ආර්ය කණ්ඩායම් දෙකක් දක්වන්න.

ii ආර්යයන් විසින් මෙරට පිහිටුවා ගත් ජනපද පහක් නම් කරන්න.

iii ලංකාවට සංක්‍රමණය වූ මුල් ආර්ය කණ්ඩායම්වල ආර්ථික රටාව හඳුන්වා දෙන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

04

i මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කරන විට මෙරට පාලනය කළ රජු කවරෙක් ද?

ii මිහිඳු මහ රහතන් වහන්සේ සමඟ ලක්දිවට පැමිණි පිරිස නම් කරන්න.

iii මිහිඳු මහ රහතන් වහන්සේ විසින් මෙරට සිදුකළ ආගමික, ශාසනික සේවාව කෙටියෙන් දක්වන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

05

i වළගම්බා රජතුමාගේ කාලය වැදගත් වීමට හේතු දෙකක් ලියන්න.

ii වසභ රජතුමාට 'දුටග' හා 'උතර' යන නම්වලින් පුතුන් දෙදෙනෙකු සිටි බව සඳහන් සෙල්ලිපි දෙක නම් කර ඇත්තේ කෙසේ ද?

iii ධාතුසේන රජතුමා විසින් සිදු කරන ලද ආගමික සේවාවන් තුනක් සඳහන් කරන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

06

i ලෝකයේ බිහි වූ මුල් ම විශ්ව විද්‍යාල දෙකක් නම් කරන්න.

ii අනුරාධපුර යුගයේ පැවති පිරිවෙන් තුනක් සඳහන් කරන්න.

iii කෝට්ටේ යුගයේ අධ්‍යාපනික තත්ත්වය පිළිබඳ ව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

07

i මහනුවර යුගය වන විට ශාසනික පිරිහීමට බල පෑ හේතු තුනක් ලියන්න.

ii විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් දෙක ආරම්භ කරන ලද්දේ කවුරුන් ද?

iii වැලිවිට සරණංකර තෙරුන් වහන්සේගෙන් සිදු වූ ශාසනික සේවාව කෙටියෙන් දක්වන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

08 පහත මාතෘකා තුනකට කෙටි සටහන් ලියන්න.

i ෆාහියන්ගල ලෙන

ii පණ්ඩුකාභය කුමාරයා

iii අභයගිරිය

iv කෝට්ටේ යුගයේ අධ්‍යාපනය

v රාජ්‍ය ලාංඡනය (ලකුණු 5 x 3 = 15)